# 67.

# අපි අලුතෙන් ඉපදෙමු. නව මිනිසත් වරම් ලබාගෙන එන්න, මා සමග ගමන් කරන්නට.

**2026 ජනවාරි 11**

“ මේ වසරත් භයානකයි. පසු ගිය වසරෙ අවසාන භාගයේ පටන් ගත්තනෙ, ඒ භයානකකම. මේ තත්ත්වය 2035 පමණ වන තුරුත් ඉදිරියට ඇදිලා යනවා. දැන් පියාණන්ගෙ පවිත්‍ර කිරීම වේගවත් වෙලා, ඒ දැහැමි යුගයේ උදාව උදෙසායි. මගේ ශ්‍රාවක කැඳවීම කියන්නෙ උතුම් පදවියක්. ඒක ප්‍රකෝටි ගාණකින් තෝරාගෙන තිබෙන සුළු පිරිසක්. මේ තෝරාගනු ලැබුවන් අතරින් ස්වල්ප දෙනයි, දැන් ඉතිරිව සිටින්නේ. අනෙක් අයට නව අවස්ථාව දීල තියෙනවා, ආපසු හැරෙන්න. මේ දැක්ම හරි විදියට, මේ මගේ ප්‍රකාශ වීමේ පණිවුඩය හරි විදියට ගියා නම් ඔවුන් පෙරළා පැමිණෙනවා. ඉතින් තවමත් අඩුපාඩු තියෙනවා. මම මේ අඩුව ගැන පෙන්වන්නයි ආවෙ. පසු ගිය දේ සිහි නොකරන්න, දැන් අලුත් දෙයක් අලුත් ආරම්භයක්. ඔබ අතර තිබෙන වාද විවාද සියල්ල දැන් අවසන් විය යුතුයි, ඒ සියල්ල පුළුස්සා දැමිය යුතුයි. දැන් අලුත් සිතුවිලි සමග අලුත් හැසිරීම් සමග ඉදිරියටම යන්න ඕනැ. මේ පැමිණෙන භයානකකම ලෝකයට හඳුන්වා දෙන්නට නම් මේ පුංචි ශ්‍රාවක පිරිස මෙය ලෝකයට එළිදැක්විය යුතුයිනේ. ඔබ ද දැනුවත් වෙමින් ලෝකය ද දැනුවත් කළ යුතුයි. ඊළඟට මේ ව්‍යසනය කවුරුන් වෙතට පියාණන් එවයි ද කියන එක පියාණන් පමණයි දන්නේ. මා තෝරාගත් ශ්‍රාවක පිරිසට ඇති සෙනෙහස නිසයි, මා ඔබට මෙය කියන්නේ. මේ ලෝකය ගලවා ගන්නට සුළු පිරිසකට බැරිකමක් නැහැ. තමාව අමතක කරල, තමා සන්තක සියල්ල අත්හැරලා තමාව මුළුමනින් අළු දූවිලි කරල ලෝකයා වෙනුවෙන් ඉදිරියට යන්න පුළුවන් වෙන්න ඕනැ. දැන් දුටුවනේ, සිදු වුණ දේ ? රැස් කළ සියල්ල සැනෙකින් නැති වුණා. ජීවිත නැති වුණා. මෙලොවට අයිති මොන දේ රැස් කළත් වැඩක් තියෙනවාද?

මා ප්‍රේමවන්ත දරුවෙනි, අලුත් වසර මුලම මා මෙතැනට පැමිණුණේ ඊළඟ පියවර ස්තුති කරමින් යාච්ඤා කරමින්, අනෙක් අයවත් දිරිමත් කරමින්, ගැළවීමේ මාර්ගය ගැන පහදා දෙමින් ඒ භයානක තත්ත්වයන්වලදී සියල්ලන් අත්වැල් බැඳගෙන එකට යා යුතු බව කියන්නට. ඔයාල ලෝකයට පණිවුඩකරුවන් වෙන්නට ඕනැ. ඔබ යන යන තැන ඒ දේ ඔබලගෙන් සිදු වෙන්නට ඕනැ. මොන ආගමකට අයිති වුණත් ඒ සිදුවීම්වලට සියල්ලන්ට පොදුවේ මුහුණ දෙන්න සිදු වෙනවා. ජාති කුළ ආගම් භේද හිතන්නටවත් අවශ්‍ය නැහැ, මේ මොහොතේ. එහෙම හිතල නොවෙයිනේ ඒ විපත් පැමිනුණේ. ඉදිරියේ මීට වඩා කොයි විදියට සිටියොත් ද ජීවිතේ රැකෙන්නේ ? ඔබ සතු සියල්ලේ අයිතිය අත්හරින්න. ඔබ ඔබව ද අත්හරින්න. පියාණෙනි, ඔබගේ කැමැත්ත ලෙස මට සිදු වේවා යි කියන්න. මා ප්‍රේමවන්ත දරුවෙනි, එනිසා අඳුර දුරලා ආලෝකය රැගෙන පෙරටම යන්න. මේ සංඝයත් දුර්වල වෙලා, පසුබසිනවා, හැමදාම එකම දේ. ප්‍රේමයේ විවෘත වීමක් තුළ ආලෝකයේ පහන් දල්වල ආලෝකය කරාම යන්ඩ, එක තැන රැඳෙන්නෙ නැතිව. එක පියවරක් ඔසවල තියන්න. ඒ පියවර ඔසවන විට හරි අමාරුයි. ඒත් ඔසවන පියවර පහසු විදියට ඔසවන්න, බලන්න. එලෙස පියවරෙන් පියවර යන්න. පළමුවෙන් තමාව පවිත්‍ර කර ගන්න ඕනැ. තර්ක විතර්ක කිසිවක් අවශ්‍ය නැහැ. ඔබ කරන හැම දේම පියාණන් දුටුවම ඇති. ලෝකය ඉදිරියේ නිරුවතින් තමා එදා මා කුරුසියේ ඇණ ගැසුවෙ. මෙය නිරුවතේ ගමනක්. නින්දා අපහාස කොන්වීම් ප්‍රතික්ෂේපයන් මැද ගමනක්, පිළිගැනීම් නැහැ. දේව අනුග්‍රහය තුළ දෙවියන් වහන්සේ පමණයි, ඔයාලට ඉන්නේ, ඔයාලව පිළිගන්නෙ. මම මේ ක්‍රියාවලියේ මුල සිටම පවසා තිබෙනවා. හඬා වැළපෙමින් දුවන මොහොතක් එනවා කියල. මේවා මට වැරදිලා කියවුණ දේ නොවෙයි, මේවා දේව අනුග්‍රහය විසින් පියාණන් විසින් ගලාගෙන එන්න සැලැස්වූ දේ.

මා තෝරාගත් චතුරංග මේ මොහොතේ යම් කාර්යයක යෙදී සිටිනවා. එය මා ඔහුට බාරදුන් දෙයක්. ඒක ලෝකයට එළි දැක්විය යුතු චිත්‍රපටියක්. ඒක අනිවාර්යයෙන්ම කරන්නටම ඕනැ, හෙලේනව ශුද්ධවන්තභාවයට උසස් කර ගන්නට. ඒ චිත්‍රපටියට ඕනැ විදියට මේ ව්‍යසනයෙ කොටසකුත් ඒකෙ තියෙනවා, ඉදිරියේ සිදු වන දේවලුත් ඒ චිත්‍රපටියට එනවා. නිසි ලෙස ඒ චිත්‍රපටිය

නිර්මාණය කරන්නට ලොකු කැපවීමක් කරමින් ඒ හැම කෙනෙක්වම ඒකට දායක කර ගනිමින් ඒ කාර්යය තුළ මම ඔහුව හිරකරලයි තියෙන්නේ. ඒ කාර්යය සඳහා ඔහු ලොකු සටනක් දෙනවා. ඒ චිත්‍රපටිය ලොකු ප්‍රසිද්ධියක් ලබයි, ඉදිරියේදී. සභාවෙන් මේකට ලොකු ගැටළු තියෙනවා, ආරවුල් තියෙනවා. නමුත් ඒ සියල්ල ජය ගන්නවාමයි. ඉතින් අපි ඒක හරහා මේ සියල්ල ලෝකයට දෙමු. ඇය ඇත්තටම ශුද්ධවන්තියක්, තම සිරුරේ මගේ වණ කැළැල් දැරූ නිර්දෝෂී කන්‍යාවක්, දේව දාසියක්. ඉතින් ඇයව නිසි තැනට ගේන්න ඕනැනේ. පූජකවරයටත් ඒ කටයුතු සඳහා ලොකු බාධක පරීක්ෂා තියෙනවා. ඔහුව මම ඒ මීසමට කැඳෙවුවෙත් ඒ සඳහාමයි. නමුත් ඔහුටත් දැන් බාධා මතු වෙමින් බොහෝ තැන්වල ගැටළු සහගත තැන් ඇති වෙමින් තියෙනවා. ධර්ම අධර්ම යුද්ධයක් මැදයි, මේ කාර්යය සිදු වන්නේ. මිසමේ ලොකු තරුණ පිරිසක් සිටිනවා. ඔවුන් විවිධාකර ගැටළු අරගෙන එනවා. මෙයට විරුද්ධ අයත් ඉන්නවා. දැන් සෑහෙන දුරකට සමථයකට ඇවිත් සියල්ලන් එකමුතු වෙමින් මේ කාර්යය සිදු වෙමින් පවතිනවා. ඒ සියළු බාධක අතර චතුරංග කරන්නෙ ලොකු කාර්යයක්. ඔහුව මම සංඝයට ඇතුල් නොකෙරුවට ඔහු සංඝයේම කෙනෙක් තමයි. ලෝකය ගැන, හැම දෙයක් ගැනම විස්තර කරන්නට, ඇන්තනිගෙ වුණත් වරදක් පෙන්වන්නට, අවවාද දෙන්නට මම ඔහුව දීලා තියෙනවා. අපි බැහැපත් වන්න ඕනැ. අපේ වරදක් පොඩි දරුවෙක් හරි පෙන්වනවා නම් සතුටින් එය බාර ගන්න ඕනැ. බලන්න ජුසේ වාස්, එයා කුඩා දරුවන්ට පවා කීකරු වුණා. හැම වැලි කැටයක් ගානෙම එයාගෙ ගමන් මග එයා බැහැපත්ව ඉවසිලිවන්තව ඒ ගමන ජය ගත්තා. ඉතින් ඇන්තනි, ඒ නිසා මේ හැම දේකම තියෙනවා ඉගෙන ගන්න දේවල්. පොඩි අයගෙන් වෙන්ඩ පුළුවන් සංඝයේ තව කෙනෙක්ගෙන් වෙන්ඩ පුළුවන් ඉගෙන ගන්න දේ තිබෙනවා. ඕනෑම කෙනෙක්ගෙන් ප්‍රශ්න එන්ඩ පුළුවන්, තර්ක විතර්ක එන්න පුළුවන්. නමුත් ඒවා ඔස්සේ මෙනෙහි කරමින් ඉවසමින් ගමන ජය ගන්නට ඕනැ. තේරුණාද, මා කියන දේ ? ඒ ලොකුම පණිවුඩය තමයි මට දෙන්ඩ ඕනැ වුණේ. ඒ ඇයි ? ඉදිරියේදි මීට වඩා භයානක දේ තිබෙනවා.

ස්වභාව ධර්මය දැන් පියාණන් එහෙට මෙහෙට සොලවමින් තිබෙනවා. ඒ සෙලවීම දැඩි කරන මොහොතක් තව ඉදිරියෙ තිබෙනවා. තිබුණට වඩා වෙනස් විදියක දැඩි කිරීමක් සිදුකරනවා. මුළු ලෝක ගෝලයම සොලවන තැනක් එනවා, මේ ටිකෙන් ටික වෙන දේවල් තුළ දී. සියලු ආශාවන්ගෙන් මිදිල දෙවියන් වහන්සේගේ කැමැත්ත සොයන්න ඔබත් පුරුදු වෙමින් ජනතාව ද පුරුදු කරන්න ඕනැ. ඒ තුළ අපි ජය ගෙන ඉදිරියටම යමු. මම සෙවනැල්ලක් මෙන් ඔබලා සමග සිටින්නම්. වැටි වැටී නැගිටින්නට ඕනැ. කුරුසිය කර තබාගෙන යනකොට එය ඔසවන්නට එදා මට අත දුන්නා වගේ ඔයාලගෙ ගමන් මග තුළ මම ඔයාලගෙ කුරුසිය ඔසවල දෙන්නම්. දැන් සිදු වන දෙවියන්ගෙ ශුද්ධවූ ක්‍රියාවලියේදී විටෙක ඒ දෙවියො නොවෙයි වගේ ඔබට පේන්න පුළුවන්, විටෙක මිතුරෙක් වගේ පේන්න පුළුවන්, විටෙක හතුරෙක් වගේ පේන්න පුළුවන්. මෙය වෙනස්ම ක්‍රියාවලියක්, එනිසා මෙය තේරුම් ගන්නට මනුෂ්‍යයාට අමාරුම ක්‍රියාවලියක්. එහෙත් මේ හැම දෙයක් තුළම දෙවියන් වහන්සේ ප්‍රේමයයි. දෙවියන් වහන්සේගේ උදහසත් උන්වහන්සේගේ ප්‍රේමයේම තව පැතිකඩක්. දැන් උදහසේ පියාණන්ගෙ දෙ ඇස් මානයෙයි සියල්ලන් සිටින්නේ. උදහසේ පියාණන් දෙ ඇස් ඇරල අර විශාල ඇහිපිල්ලම ගහද්දි සොබා දහම වේගයෙන් චලනය වෙනවා. පියාණන්ගෙ උදහසේ ඒ රහස දැනුයි, මා නුඹලාට හෙළි කෙරුවෙ. පියාණන් දෙ ඇස් ඇරගෙන මුළු මැවිල්ල දෙස බලා සිටිනවා. පියාණන් හෙමින් ඇහිපිල්ලම ගහද්දි බොහොම නිහඬව ඒ චලනය සිදු වෙනවා. ඇහිපිල්ලම වේගයෙන් ගහද්දි ඒ කුණාටුව අති බිහිසුණු කුණාටුවක් බවට පත් වෙනවා. අති උත්කෘෂ්ඨ කුණාටුව ඉදිරියේදි එනවා. එය මේ දේශයට පමණක් නොවෙයි, මුළු ලෝකයටම බලපාන දෙයක්. ඒ වේගවත් ඇහිපිල්ලම තවම ගැහුවෙ නැහැ. පියාණන් දෙ ඇස් විවර කරමින් ඇහිපිල්ලම වේගයෙන් ගහපු සැනින් බොහෝ දේ සුනු විසුනු වෙනවා. සියලුම ආගම්, සියලුම දෙවිවරුන් එකතුවෙලයි ඉන්නෙ, දැන්. ඒ දෙවිවරුන්ගෙත් දෙවියන් තමයි, දෙවි පියාණන්. ඒ ඉහළම තැනැත්තේ. ඊට යටයි අන් සියල්ල. මේ හැම ආගමක්ම හැමෝටම පොදුයි. එනිසා ජාති කුළ ආගම් භේද නැහැ, සියල්ලෝ එකම ජනතාවක්, එකම දේශයක ජනතාවක්, එකම ලෝකයක ජනතාවක්.

'සියල් පැවැත්මෙහි පැවැත්මයාණෙනි' ගීතිකාවේ ගැඹුර දෙස බලන්න. "සියල් පැවැත්මෙහි පැවත්මයාණෙනි, ඔබෙ ශ්‍රී නාමෙට හෝසන්නා. රජය ද බලය ද මහිමෙ ද ඔබගෙයි ඔබෙ ශ්‍රී නාමෙට හෝසන්නා." දැන් සියල් පැවැත්මෙහි පැවැත්මයාණන්ගෙ මහා මහිමය එළි දක්වන මොහොත, මුළු මැවීම සොලවන මොහොත. ඒ අති සෙලවිල්ල ඉදිරියේ දි තියෙනවා. බොහෝ අය රැස්කර ගන්නවා, තෘෂ්ණාවෙන්. අසරණයකු දෙස බලන්නෙ නැහැ. දැන් මොකද වෙලා තියෙන්නේ ? මන්දිර කඩාවැටිලා, සමහරු එතැනම මිහිදන් වෙලා. මෙලොව එළිය දුටු දරුවොත්, මෙලොව එළිය දකින්නට සූදානම්ව සිටි නොදරුවොත් ඒ පස් යට මිහිදන් වෙලා. ඒ චුටි නොදරුවො මොනවද දන්නේ ? ඔවුන් නිසැකවම සුර දූතයන් බවට පත්වෙනවා. මගේ ඊළඟ පැමිණීමේ දී ලෝකය ලස්සන තැනක් වෙනවා,

දැහැමි යුගය උදා වෙනවා. යක්ෂයා හෙවත් නපුරා කියන කෙනා ජේන්ඩ එන්නෙ නැහැ, සිතුවිල්ලෙන් වචනවලින් ක්‍රියාවලින් හැම පැත්තෙන්ම එනවා. එයා ඉන්නෙ ඔබ සමීපයේමයි. එයාව ඈත්කර ගැනීම තිබෙන්නෙ ඔබ තුළ ඇති වන්නා වූ ආලෝකයේ සිතුවිල්ල තුළයි, ධම්ම තුළයි, ධර්මයාණන්ගේ මහා ධර්ම ක්‍රියාවලිය තුළයි. පාපධාරී ශරීරයක් තුළ තමයි, පුංචි පුළුන් රොදක් වගේ දෙයක් වන ආත්මය සඟවල තියෙන්නේ. එය ශුද්ධයි. දෙවියන් වහන්සේ මනුෂ්‍ය ආත්මයකට අණ කළොත් දැන් මා වෙත එන්න කියල, එය අනිවාර්යයෙන්ම සිදු වෙනවා. ආත්මය ශරීරයෙන් වෙන් වීම යි, මරණය කියන්නේ. එලෙස මරණයට පත් වූ මනුෂ්‍යයා දෙවියන් වහන්සේ තුළ ශුද්ධවන්ත ජීවිතයක් ගත කළොත් ඒ ශරීරය පවිත්‍රව පස තුළ ලස්සනට තැන්පත් වෙනවා, සිරුර දිස්නෙ දෙනවා, සිරුර කුණු වී ඕජස් ගලන්නෙ නැහැ. බොහෝ කල්ගත වුවත් ඒ සිරුර එලෙසම පවතිනවා නම්, එය අතිශයින්ම ශුද්ධවන්ත ජීවිතයක්. ඉතින් මම අද කෙටියෙන් පැහැදිළිව ගැඹුරු පණිවුඩයක් දුන්නා. වටිනවද ඒක ? කලකට පසු පියාණන් මට කියන්ඩ කියපු ටික අරගෙන මම හදිසියේ නුඹලා වෙත පැමිණියා. දරුවෙනි, මා මෙතෙක් දුන් පණිවුඩ ඔබට හමුවන හමුවන අයට දෙන්ඩ, පත්‍රිකා ලෙස බෙදන්න පුළුවන්. බුද්ධිමත්ව ප්‍රඥාවන්තව ඒ පණිවුඩ සියල්ලන්ට දෙන්ඩ ඕනෑ. 'ශුද්ධාත්ම පිය සටහන්' ප්‍රකාශනය ඉංග්‍රිසි භාෂාවෙන් ජාත්‍යන්තරයට යැවීමේ කටයුතු දැන් නිම වීමට ඉතාමත් ආසන්නව තිබීම ගැන පියාණන් සතුට ප්‍රකාශ කරනවා. මේ සංඝය නියෝජනය කරමින් තව එක් කෙනෙක් දෙන්නෙක් හරි කමක් නැහැ ස්වර්ගයට යන්න ඕනෑ. එතැන ඉහළින් වඩින සංඝය පිහිටුවනු ලබනවා. මා තෝරාගත් ශ්‍රාවකයන්ගෙන් තිදෙනෙක් දැනටමත් එහි සිටිනවා. ඒ භාග්‍ය ඔබත් ලබා ගන්න. අද සමහරෙක් ලෝකය තුළ පිළිගැනීම් ලබන්න බොහෝ දේ කරනවා. දෙවියන් වහන්සේගේ දේ ලෝකයට ප්‍රකාශ කරමින් ප්‍රසිද්ධිය ලැබීම නොවෙයි, උන්වහන්සේගේ කැමැත්ත. රහසිගත දෙවියෝ රහසින් දැක ආශිර්වාද කරන සේක. කිසි වරදක් නොකළ නමුත්, කිසි පවක් නොකළ නමුත් නින්දා සහගත ලෙස අඬ නිරුවතින් ලෝක වාසි ජනතාව ඉදිරියේ කුරුසපත් වුණ දෙවියො මමයි. ඇයි මට බලය තිබුණෙ නැද්ද ? ඒ මගේ පියාණන්ට මගේ කීකරුකමයි. පියාණන්ගෙ කැමැත්ත ඒක නම් ඒකට ආමෙන් කියල යක්ෂයාව සදහටම පරාජය කළේ එතැනයි. ඉතින් ඒ නිසා මා ප්‍රේමවන්ත දරුවෙනි, මේ නින්දාව කියන දේ තමයි, දෙවියන්ට ප්‍රසන්න මල් මාලාව. පාපි නින්දාව නොවෙයි, ශුද්ධවූ නින්දාවයි. ආදර දරුවෙනි, මගේ පුංචි ශ්‍රාවක පිරිස, මම නුඹලාට ආදරෙයි. පියාණන් ගැඹුරින් ගැඹුරින් ගැඹුරින් ආදරය කරන පිරිසක්. ඒ ආදරයේ ආශිර්වාදය ලබන්න භාග්‍යලත් ඔබ මෙතැන් පටන් සියල්ලෙන් හිස්ව පියාණන්ට ආමෙන් කියන තැනට සුදුසු සංඝයක් වෙන්ඩ. ඔබ කවුරුන් අතිනුත් වැරදි සිදු වෙන්න ඇති, නුසුදුසු වචන කියවෙන්ඩ ඇති, වාද විවාද සිදු වෙන්න ඇති. දැන් ඒවාට ඉඩක් නැහැ. දැන් පාරිශුද්ධත්වය කරා, ශුද්ධවන්තභාවය කරා තරඟයක් තමයි, ඔබ ඉදිරියේ තිබෙන්නේ. අපි අලුතෙන් ඉපදෙමු. නව මිනිසත් වරම් ලබා ගෙන එන්න, මා සමග ගමන් කරන්නට. පියාණෝ ද පුත්‍රයාණෝ ද ශුද්ධාත්මයාණෝ ද වන මම ඔබලා ආශිර්වාද කර ආරක්ෂා කරමි, පොරොන්දු වෙමි.”

,

http://dahamnavodaya.com